**ශීර්ෂය 316 - වයඹ පළාත් සභාව - 2023**

---

**1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය**

**1.1 දැක්ම**

තිරසර ලෙස සංවර්ධිත වයඹ පළාතක්

**1.2 මෙහෙවර**

වයඹ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින්, ගෝලීය තරඟකාරීත්වය තුළ තෘප්තිමත් ජනසමාජයක්, අනුවර්තනීය ආර්ථිකයක්, හරිත පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා භෞතික, මූල්‍ය හා මානව සම්පත් කළමනාකරණය.

**1.3 කාර්යභාරය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

**2. මූල්‍ය ප්‍රකාශන**

**ශුද්ධ ප්‍රතිපාදනය උපයෝජනය හා ඉතිරිය**

වයඹ පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 47,429 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 42,305.34 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 5,123.66 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 ක පමණ ප්‍රතිපාදන ඉතිරියක් විය. එම මුළු ඉතිරියෙන් රු.මිලියන 1,633.45 ක් හෙවත් සියයට 42 ක් පමණ මූලධන ප්‍රතිපාදන වලින් වන අතර, පුනරාවර්ථන ප්‍රතිපාදන ඉතිරිය රු.මිලියන 3,490.21 ක් හෙවත් සියයට 8 ක් පමණ විය. අයවැය ඇස්තමේන්තුගත මුළු ප්‍රතිපාදන අක්මුදල් සපයාදීමට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට නොහැකි වීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරියක් පෙන්නුම් කර තිබුණි.

| වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | 2023 දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|---|---|
| | | උපයෝජනය | ඉතිරිවීම | ඉතිරිවීම ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | % |
| පුනරාවර්තන | 43,526.00 | 40,035.79 | 3,490.21 | 08 |
| මූලධන | 3,903.00 | 2,269.55 | 1,633.45 | 42 |
| එකතුව | **47,429.00** | **42,305.34** | **5,123.66** | **11** |

**3. විගණන නිරීක්ෂණ**

ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන පළාත් සභාව විසින් පළාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයන් සිදු කර තිබුණි. පළාත් සභා අරමුදල විගණනය කර ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.